**කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනය කිරීම උදෙසා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය**

------------------------------------------------------------------------------------------------------------

1. **මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව මෙම වාර්තාවේ 5 ජේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මාගේ මතය වනුයේ,

(අ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස අටක කාලපරිච්ජේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2010 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මුල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන**

----------------

2.1 **මූල්‍ය කාර්ය සාධනය**

-----------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස අටක කාලපරිච්ජේදය සඳහා ව්‍යාපෘතියේ වියදම රු. 5,179,191 ක් විය. සමාලෝචිත මාස 08 ක කාලපරිච්ජේදය සඳහා වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විස්තරය | 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 08 ක කාල පරිච්ඡේදය සඳහා වියදම |
|---|---|
| | රු. |
| ප්‍රාග්ධන වියදම් | |
| ආපසු ගෙවිය හැකි තැන්පතු : ජලය බෙදාදීම | 37,400 |
| මෙහෙයුම් පිරිවැය | |
| පෞද්ගලික පඩිනඩි | 3,949,823 |
| උපදේශක ගාස්තු | 432,151 |
| කාර්යාල වියදම් | 178,730 |
| මෝටර් වාහන නඩත්තු | 362,764 |
| ලිපිද්‍රව්‍ය | 69,857 |
| ප්‍රවාහන හා ගමන් ගාස්තු | 44,887 |
| සන්නිවේදන | 103,579 |
| **එකතුව** | 5,179,191 |

## 3. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 3.1 ගිණුම් අඩුවෙන් දැක්වීම්

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ ශීර්ෂ අංක 243 යටතේ 2010 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම අනුව ව්‍යාපෘතියේ තථ්‍ය වියදම රු.5,392,136 ක් වුවද ව්‍යාපෘතිය විසින් 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 8 සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව එම වියදම රු. 5,179,191 ක් වූයෙන් රු. 212,945 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 3.2 ලෙජර් පවත්වා ගෙන යාම

සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල ශේෂ සනාථ කර ගැනීම සඳහා ලෙජර් පවත්වා නොතිබුණු අතර ශේෂ පිරික්සුමක්ද සකස් කර නොතිබුණි.

## 3.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | |
| (i) 2.2.1 ඡේදය | ඇගයීම් වාර්තාව අනුව මෙම ව්‍යාපෘතිය සඳහා මුළු කාල පදනම මත මූල්‍ය කළමනාකරුවෙකු පත්කල යුතු වුවද වර්තමාන රාජකාරියට අමතර රාජකාරි පදනම මත ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික කවුන්සිලයේ ගණකාධිකාරීවරයා මූල්‍ය කළමනාකරු ලෙස පත්කර තිබුණි. |
| (ii) 2.2.9 ඡේදය | ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්, පලපුරුද්ද සහ නිපුණතාවය තහවුරුකර ගැනිම සඳහා පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීනව පවත්වා නොතිබුණ අතර පෞද්ගලික ලිපිගොනු තුල අඩංගුකර තිබූ සහතිකද සහතික කල පිටපත් නොවීය. |
| (iii) 4.1.3 ඡේදය | වර්තමාන රාජකාරියට අමතර රජකාරි පදනම මත ව්‍යාපෘතියට පත්කර තිබුණු නිලධාරීන් තිදෙනෙකු සඳහා වැටුප් ගෙවීමේදී ව්‍යාපෘතියේ එම තනතුරට අදාල සම්පූර්ණ වැටුපම ගෙවා තිබුණි. මීට අමතරව සම්පූර්ණ වැටුප සඳහා සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායකය ගෙවා තිබුණි. ඒ අනුව 2010 ජුනි සිට දෙසැම්බර් දක්වා වැඩිපුර ගෙවූ මුදල රු.1,314,470 විය. |

## 4. කාර්ය සාධනය

----------------

### 4.1 ප්‍රතිපාදන ඌන උපයෝජනය

-------------------------------

ව්‍යාපෘතියේ ණය ගවිසුම් අත්සන් කිරීම ප්‍රමාද වීම නිසා 2010 වර්ෂයේ සලසන ලද අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන පහත පරිදි ඉතිරි වී තිබුණි.

(අ) දේශීය අරමුදලේ ශුද්ධ ප්‍රතිපාදිත මුදල රු.10,000,000 ක් වූ අතර වැය කර ඇති මුදල රු. 5,179,191 ක් විය. ඒ අනුව වැය නොකළ ප්‍රතිපාදිත මුදල රු. 4,820,809 ක් එනම් ප්‍රතිපාදිත මුදලෙන් 48 % ක් විය.

(ආ) විදේශ අරමුදල් සඳහා වෙන් කළ ශුද්ධ ප්‍රතිපාදනය වූ රු. 99,750,000 ක සම්පූර්ණ මුදලම ඉතිරි වී තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීමට සැලසුම් කල රු.19,300,000 ක විෂයයන් 10 ක් ප්‍රසම්පාදනය කර නොතිබුණි.

## 5. ගිණුම් ඉදිරිපත් කිරීම

------------------------

අංක 4804 - එල් කේ දරන ණය ගිවිසුමෙහි උපලේඛන 2හි II (ආ ) වගන්තිය අනුව මූල්‍ය වර්ෂය අවසාන වී මාස 6 ක් ඇතුලත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර සංවර්ධන සංගමය වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 08 ක කාලපරිච්ඡේදය සඳහා අදාළ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2012 පෙබරවරි 23 වන දිනදීය. 2011 අගෝස්තු 08 සිට 17 දක්වා වූ ලෝක බැංකු දූත මණ්ඩල වාර්තාවේ 43 වගන්තිය අනුව 2010 මූල්‍ය වර්ෂය සඳහා විදේශීය ව්‍යාපෘති අරමුදල් යටතේ වියදම් නොමැති බැවින් පළමු විගණිත මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 30 දිනට ඉදරිපත් කළ යුතු බවට එකඟ වී තිබුණි.

## 6. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ලෙජර් ගිණුම් පැවැත්වීම.

(ආ) මෝටර් වාහන සඳහා දෛනික ධාවන සටහන් හා ලොග් පොත් පැවැත්වීම.

(ඇ) පෞද්ගලික ලිපිගොනු පැවැත්වීම.